**සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ ස්වාමී විපුලානන්ද ආයතනය - 2017**
**-----------------------------------------------------------------------**

සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ ස්වාමී විපුලානන්ද ආයතනයේ ("ආයතනය") 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සහ 108 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්ව විද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**
**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**
**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

-----

මූල්‍ය ප්‍රකාශනවලින්, 2017 දෙසැම්බර් 31 දිනට සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ ස්වාමි විපුලානන්ද ආයතනයේ (SVIAS) මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

හිටපු ගබඩා භාරකරුවකුගේ රාජකාරි අත්හිටුවීම සම්බන්ධයෙන් නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලමින් හා රු.මිලියන 1 ක වන්දි ආයතනයෙන් ලබා ගැනීම සඳහාත් ඔහු විසින් කම්කරු අධිකරණයේ නඩුවක් ගොනුකර තිබුණි. කෙසේ වුවද, මෙම කරුණ සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට ආයතනය අපොහොසත් වී තිබුණි.

### 2.3 ලැබිය යුතු ගිණුම්

-------------------

සේවය තහනම් කරනු ලැබූ හා මියගිය සේවකයන් 07 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.625,015 ක් වූ සේවක ණය ශේෂ අයකර ගැනීමට හෝ ගිණුම්වලින් ලියා හැරීමට කටයුතු කිරීමෙන් තොරව වර්ෂ 05 කට වැඩි කාලයක් ගිණුම්වල පැවතුණි.

### 2.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

-----------------------------------------------------------------------------

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහයේ IX පරිච්ඡේදයේ 4.3 හා 4.4 වගන්ති | අතිකාල දීමනා ගෙවීම් සඳහා දක්වා ඇති පරිදි වෙනම ලේඛනයක් ආයතනය විසින් පවත්වා නොතිබුණි. |
| **(ආ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| | මුදල් රෙගුලාසි 880 | ආයතනයේ අධ්‍යක්ෂ, නියෝජ්‍ය ලේඛකාධිකාරී, ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී, සහකාර මූල්‍යාධිකාරී හා ගබඩා භාරකරුගෙන් ඇප තැන්පතු ලබාගෙන නොතිබුණි. |
| | මුදල් රෙගුලාසි 371 | ලබාගන්නා ලද තත්-කාර්ය අතුරු අග්‍රිම අදාළ කාර්යය නිම කළ වහාම පියවිය යුතු වුවද, එකතුව රු.946,665 ක් වූ එවැනි අග්‍රිම 21 ක් දින 12 සිට දින 188 දක්වා වූ කාල පරාසයක ප්‍රමාදයකින් පසුව නිරවුල් කර තිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | **2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය** | උප අග්‍රිම මූල්‍ය වර්ෂයේ දෙසැම්බර් 31 ට පෙර නිරවුල් කළ යුතු වුවද, රු.43,225 ක් වූ උප අග්‍රිම 03 ක් දක්වා ඇති පරිදි 2017 දෙසැම්බර් 31 දිනට නිරවුල් කර නොතිබුණි. |
| (ඈ) | **රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ආ) සහ (ඉ) මාර්ගෝපදේශය** | (i) අවම වශයෙන් වර්ෂ 03 ක කාල පරිච්ඡේදයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කාර්යයන් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මේ ලැයිස්තුගත කළ යුතු වුවද, එවැනි ආකාරයකින් ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.<br><br>(ii) රු.මිලියන 6.46 ක් වටිනා ප්‍රතිසංස්කරණ කාර්යයන් 2 ක් 2017 වර්ෂයේ ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

--------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.4,637,623 ක ශුද්ධ ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ ශුද්ධ අතිරික්තය රු.6,486,866 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ මූල්‍ය ප්‍රතිඵලයේ රු.11,124,489 ක පිරිහීමක් දැක්වුණි. පුද්ගලික පඩිනඩි හා ගිවිසුම්ගත සේවා රු.30,487,533 කින් වැඩිවීම මෙම පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සඳහා ශුද්ධ ඌනතාවය රු.4,637,623 ක් වුවද, පුද්ගලික පඩිනඩි, රජයට ගෙවන ලද බදු හා සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂය සැලකිල්ලට ගැනීමෙන් පසු ආයතනයේ අගය එකතු කිරීම රු.145,980,620 ක් විය. තවද, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ ආයතනයෙන් රටට වූ දායකය රු.15,955,700 කින් වර්ධනය වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**4.1 කාර්යසාධනය**

----------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණනයට ලැබුණු තොරතුරු අනුව, සිසුන් බඳවා ගැනීම පිළිබඳව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යනු ලැබූ වාර්තා හා ආයතනයේ වාර්තා අතර වෙනසක් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| අධ්‍යයන වර්ෂය | බඳවා ගැනීමට යෝජිත සිසුන් සංඛ්‍යාව | බඳවා ගත් සිසුන් සංඛ්‍යාව | | වෙනස |
|---|---|---|---|---|
| | | ආයතනයට අනුව | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට අනුව | |
| 2014/2015 | 230 | 208 | 229 | 21 |
| 2015/2016 | 230 | 189 | 211 | 22 |
| 2016/2017 | 230 | 208 | 225 | 17 |

නිවැරදි තොරතුරු පවත්වා නොගැනීම හේතුවෙන් හා මෙම ආයතන දෙක අතර විධිමත් හා නිරවද්‍ය සම්බන්ධීකරණ ක්‍රමයක් නොමැති වීම හේතුවෙන් සිසුන් බඳවා ගැනීම සම්බන්ධයෙන් තීරණ ගැනීමේදී එය අහිතකර අන්දමින් බලපා තිබුණි.

(ආ) ආයතනයක් විසින් පවත්වන පර්යේෂණ එම ආයතනයේ ප්‍රමිතිය ඉහළ නැංවීම සඳහා උපකාරි වන අතර එසේම ජාතික ආර්ථිකයට විශාල දායකයක් එයින් සැපයෙනු ඇත. එබැවින් පර්යේෂණ පැවැත්වීම සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 4 දෙනෙකු වෙනුවෙන් ආයතනය විසින් රු.587,286 ක මුදලක් වෙන්කර තිබුණි. කෙසේ වුවද ඔවුන්ගේ පර්යේෂණ යෝජනා 2018 සැප්තැම්බර් 27 විගණන දිනය වන විටත් ඔවුන් විසින් ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේ ප්‍රමාදයන්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2015 නොවැම්බර් 17 දිනැති අංක 15/2015 දරන ආයතන චක්‍රලේඛය අනුව, අභ්‍යන්තර සිසුන් සඳහා පවත්වන ලද විභාගවල ප්‍රතිඵල මාස 03 ක් ඇතුලත නිකුත් කළ යුතුය. කෙසේ වුවද, 2012/2013 අධ්‍යයන වර්ෂය වෙනුවෙන් ආයතනයේ පවත්වන ලද අවසාන විභාග සඳහා ප්‍රතිඵල මාස 06 ක ප්‍රමාදයකින් පසුව නිකුත් කර තිබුණි. විභාග සමත් වීමෙන් පසු සිසුන්ට රැකියා අවස්ථා ලබා ගැනීමේදී මෙම පරිචය අහිතකර ලෙස බලපා තිබුණි.

## 4.2 කළමනාකරණ කාර්යයන්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගිවිසුම් කඩ කිරීම හේතුවෙන් නිලධාරීන් තිදෙනෙකුගෙන්, ඔවුන්ගේ බැඳුම්කර වටිනාකම වශයෙන් රු.7,951,181 ක මුදලක් වර්ෂ 1 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි. කෙසේ වුවද, ඔවුන්ගෙන් වලංගු ඇපකරයන් ලබා නොගැනීම හේතුවෙන් එම හිඟ ශේෂයන් අයකර ගැනීමට ආයතනයට නොහැකි වී තිබුණි.

(ආ) 2009 අප්‍රේල් 16 දිනැති අංක 9/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව, නිලධාරීන් සංඛ්‍යාව 25 ට වැඩි වන්නේ නම් ඔවුන්ගේ පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සටහන් ස්කෑනර් යන්ත්‍ර භාවිතා කළ යුතුය. ආයතනයට නිලධාරීන් 94 දෙනෙක් අනුයුක්ත කර සිටියද, ආයතනය විසින් ඇඟිලි සටහන් ස්කෑනර් යන්ත්‍ර භාවිතා කර නොතිබුණි.

(ඇ) අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිවාඩු ලේඛනය විධිමත්ව පවත්වා නොතිබු අතර අදාළ විධායක නිලධාරියා විසින් අධීක්ෂණය කර නොතිබුණි.

**4.3 සේවක පරිපාලනය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෘශ්‍ය හා තාක්ෂණික කලා දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය හා පරිවාස කථිකාචාර්ය තනතුරු 2013 වර්ෂයේ සිට පුරප්පාඩු වී පැවතුණි. කෙසේ වුවද, මෙම දෙපාර්තමේන්තුව විසින් තාවකාලික සහාය කථිකාචාර්යවරු හා බාහිර කථිකාචාර්යවරු මඟින් අධ්‍යයන කටයුතු පවත්වා ගනිමින් තිබුණි. මෙම තත්ත්වය සිසුන්ගේ අධ්‍යයන කටයුතුවලට බලපා තිබුණද, ආයතනය විසින් 2018 සැප්තැම්බර් 27 විගණන දිනය වන විටත් එම පුරප්පාඩු පුරවා නොතිබුණි.

(ආ) ගබඩා භාරකරු තනතුර 2012 ජූලි 02 දින සිට පුරප්පාඩු වී පැවතුණි. කෙසේ වුවද, එම තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත් කිරීමට කටයුතු කිරීමෙන් තොරව ඉහත තනතුරු සඳහා අදාළ රාජකාරි වැඩ බැලීමේ පදනම මත නැගෙනහිර විශ්ව විද්‍යාලයේ ගබඩා භාරකරු මඟින් සිදුකර ගෙන තිබුණි.

**5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**ක්‍රියාකාරි සැලැස්ම**

ආයතනය විසින් 2017 වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරි සැලැස්මේ 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4 ඡේදය ප්‍රකාරව යාවත්කාලීන කරන ලද සංවිධාන ව්‍යුහය, අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය හා අභ්‍යන්තර විගණන සැලැස්ම යනාදි තොරතුරු ඇතුළත් කර නොතිබුණි.

**6. පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | සේවක පරිපාලනය | පුරප්පාඩු පිරවීම සඳහා පියවර නොගැනීම. |
| (ආ) | ලැබිය යුතු ගිණුම් | දිගුකාලීන හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඇ) | විභාග ප්‍රතිඵල නිකුත් කිරීම | විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේදී ප්‍රමාදයන් |